# ප්‍රධාන ලේකම් චක්‍රලේඛ
# 04/2023 සහ සම්බන්ධිත කරුණු

## චක්‍රලේඛය අදාල වන්නා වූ ඔප්පු වර්ග

1. විකුණුම් ඔප්පු
2. ත්‍යාග ඔප්පු
3. හුවමාරු ඔප්පු

දේපලක අයිතියක් පුද්ගලයෙකුගෙන් / නෛතික පුද්ගලයෙකුගෙන් (පුද්ගලික සමාගමක්), වෙනත් පුද්ගලයෙකුට / නෛතික පුද්ගලයෙකුට ගලායාම මෙහි විශේෂත්වයයි.

## විකුණුම් ඔප්පු

i) සාමාන්‍ය විකුණුම් ඔප්පු
ii) කොන්දේසි සහිත විකුණුම් ඔප්පු
iii) පැවරුම්කර
iv) බැංකු මගින් දේපල පවරා දෙන ඔප්පු

## හිමිකම් සහතික


i) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නිකුත් කරනු ලබන සහතිකයක්.

ii) අංක 2308/27 සහ 2022.12.01 දිනැති ගැසට් නිවේදනය මගින් හඳුන්වා දී ඇති පරිදි එක් එක් ඔප්පු වෙනුවෙන් සාධන පත්‍ර යනුවෙන් හඳුන්වනු ලබන ආකෘති පත්‍ර පවතී.

iii) දේපළ අයිතිය දක්වන්නා වූ ලේඛණය හිමිකම් සහතිකයක් නම් සියලු කාර්යාලයීය අවශ්‍යතා සඳහාත් මුද්‍රා තැබීම සඳහාත් සාධන පත්‍රයේ සහතික පිටපතක් අවශ්‍ය වේ.

## පළමු වරට නිකුත් කරනු ලබන හිමිකම් සහතික සම්බන්ධයෙන් වන විට,

- අයිතිය වෙනස් කමකට ලක් නොවී පවත්නා අයිතිකරු වෙතම නව හිමිකම් සහතිකයක් ප්‍රථම වරට නිකුත් කිරීමේදී, ඒ සඳහා සාධන පත්‍රයක් ලියා සකස් කිරීමක් සිදු නොකෙරේ.
- ඒ වෙනුවට පවත්නා සාමාන්‍ය ඔප්පුව මත අදාල ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් මුද්‍රා තැබීමක් සිදු කෙරේ.



- එවැනි අවස්ථාවන්හිදී මුද්දර කාර්යය සඳහා අප විසින් අදාල කර ගත යුත්තේ එම මුද්‍රා තැබූ ඔප්පුව සහ එහි සඳහන් දිනයයි.

## චක්‍රලේඛය අදාල වන ඔප්පුවක්ද යන්න පරීක්ෂා කිරීම,

- ඔප්පුවේ වර්ගය දැක්වෙන නාමින්
- ගෙවා ඇති මුද්දර ගාස්තුවෙන්, සිදු කල හැක.

## මුද්‍රා තබා ගැනීම සඳහා ඉදිරිපත් නොකළ යුතු ලේඛණ

- කාල සීමාව නොසලකා, චක්‍රලේඛය අදාල වන්නා වූ ඔප්පු වර්ග හැර අනෙකුත් සියලුම ඔප්පු.
- චක්‍රලේඛය අදාල වන්නා වූ එහෙත් 2019.12.31 දින හෝ ඊට පෙර ලියා සහතික කල ඕනෑම ඔප්පුවක්.

## මුද්‍රා තබා ගත යුතු ඔප්පු / සාධන පත්‍ර සමග ඉදිරිපත් කල යුතු අනෙකුත් ලේඛණ

අදාල ඔප්පුවේ / සාධන පත්‍රයේ පිටපතක්

ඉඩමේ සැලැස්මේ පිටපතක්

පූර්ව ඔප්පුවේ පිටපතක්

ගොඩනැගිල්ලක් ඇත්නම් ඒ පිලිබඳ විස්තර

(දිග පළල,මහල් ගණන ආදී)

ඉඩමේ සහ ගොඩනැගිල්ලේ ඡායාරූප

Google මගින් ලබාගත් පිහිටීම (Location)

ඉහත සඳහන් ලේඛණ අතුරින් සියල්ලම පැවතීම කාර්යය කඩිනමින් ඉටු කිරීමට පහසුවකි. එනමුත් අදාල ඔප්පුවේ / සාධන පත්‍රයේ පිටපතක් ඇත්නම් අනෙකුත් ලේඛණ නොපැවතීම මත පමණක් කාර්යය ඉටු කිරීමට එය බාධාවක් නොවන්නේය.

**AND I FURTHER CERTIFY AND ATTEST** that the Duplicate of this instrument bears receipt No.382085 *issued by the Peoples Bank New Town Ratnapura Branch* for the payment of the sum of Rupees Five Hundred Fifty Nine Thousand (Rs.559,000/=) being the payment of stamp duty to the Sabaragamu Province Provincial Council in respect of this deed , and the Original of this instrument bears one stamp to the value of Rupee One (Re 1/=).

මෙම ඔප්පුවේ මුල් පිටපතට රුපියලක් වටිනා මුද්දරයක් ඇලවූ බවද, ඒ මුද්දරය මා විසින් සපයා ගත් බව ද, දෙවන පිටපතට රුපියල් එක් ලක්ෂ තිස් නව දහස (රු.139,000/=) ක මුදලක් මහජන බැංකුවේ රත්නපුර නවනගර ශාඛාවේ සබරගමුව පළාත් ආදායම් කොමසාරිස්ගේ ගිණුමට බැර කරන ලද අංක 331863 සහ 2022.07.05 දිනැති ලදුපත අලවා ඇති බවද, වැඩි දුරටත් සහතික කරමි.